# 7 – පාඩම
# විධි ක්‍රියා

# ක්‍රියාකාරකම 1

❖ සුදුසු පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න .

1. කිරීමක් ,විඳීමක් හෝ සිදුවීමක් ගැන කියවෙන පද …………… ලෙස හැඳින්වේ.

I විධි ක්‍රියා පද   ii ක්‍රියා පද   iii ආශීර්වාද ක්‍රියා   iv අනවසාන ක්‍රියා

2. වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා ……………….නම් වේ .

i අවසාන ක්‍රියා   ii ක්‍රියා පද   iii ආශීර්වාද ක්‍රියා   iv අනවසාන ක්‍රියා

3. යම් විධානයක් , නියෝගයක් ,ඉල්ලීමක් කරන ක්‍රියා පද ……………. නම් වේ .

i පූර්ව ක්‍රියා   ii මිශ්‍ර ක්‍රියා   iii ආශීර්වාද ක්‍රියා   iv විධි ක්‍රියා

**4 .** “ ඉර පායා ඉර මුදුනට <u>**එන්ට එපා**</u> ” ඉරි ඇඳී පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ

i පූර්ව ක්‍රියා   ii විධි ක්‍රියා   iii ආශීර්වාද ක්‍රියා   iv ප්‍රයෝජ්‍ය ක්‍රියා

5 . ආශීර්වාද ක්‍රියා …………………………… නමින් ද හැඳින්වේ .

i අසම්භාව්‍ය ක්‍රියා   ii මිශ්‍ර ක්‍රියා   iii ප්‍රාර්ථනා ක්‍රියා   iv ප්‍රයෝජ්‍ය ක්‍රියා

# ක්‍රියාකාරකම 2

❖ පහත සඳහන් වාක්‍යවල ඇති විධි ක්‍රියා පද උපුටා ලියන්න .

1. අකීකරු දරුව ,මෙය හොඳින් අසන්න .- ……………………...

2 . ස්වාමිනි , ගැත්තාට අනුකම්පා කරනු මැනවි . ……………………….

3. ගයව් ප්‍රීති ගී , වරෙව් සමඟි වී , තබව් පෙරට පා දැන් . ……………………….

4 . දියණියනි , නිතර පොත්පත් කියවන්න . ……………………….

5. ‘පනින්ට පෙර සිතා බලනු . ’ ……………………….

6 . කරව පියාසර සකි, කොන්තගංතොටින් . ……………………….

7. තමාගේ වැඩ අනුන්ට පවරා නොදෙන්න . - ……………………….

8 . අන්න බලන් සඳ . ……………………….

9 .සෙබළුනි , සටනට යව් . - ……………………….

10 . “ දර දමපිය , ගිනි පිඹපිය ” යනුවෙන් කොටියා ගර්ජනය කළේය. ……………………..

# ක්‍රියාකාරකම 3

❖ පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සුදුසු ආශීර්වාද ක්‍රියා වරහනින් තෝරා ලියන්න .

1 .කැලේ තිබෙන කොයි දේ වත්. - ……………………

2 . අපේ මව් බිම යෙහෙන් . ……………………………

3 .පියාණෙනි , ඔබට. - ………………………………

4 . අපි සියලු දෙනා විභාගය ………………………...

5 . රටට පැමිණෙන ස්වභාවික උවදුරු ………………....

6 . නිසි කලට වැසි ……………………………….....

7 . සියලු මඟීහු මාර්ග නීති කඩ කරන්නෝ ……………

8 . අපට යහපත් දේශයක් …………………………....

9 . තමන්ගේ තරම දැනගෙන කල් ……………………

10 . සියලු සිත් තුළ රෝ බිය …………………………

( දීර්ඝායු වේවා , දුරුවේවා , හරිනු , රස වේවා ,

තුරන් වේවා , වසීවා , නොවෙත්වා , සමත් වෙමුවා

, දිනේවා , උදා වේවා )

# ක්‍රියාකාරකම 4

❖ පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න

1. ක්‍රියා මූලය ම විධි ක්‍රියා අර්ථයේ යෙදේ .

2 . ආශීර්වාද ක්‍රියා , පුරුෂ තුනෙහි වර නැගේ.

3. ක්‍රියා රූපය අගට 'වා' යන නිපාත පදය එක්විමෙන'' විධි ක්‍රියා පද සෑදේ .

4 . ක්‍රියා මූලය ම ආශීර්වාද ක්‍රියා ලෙස යෙදේ .

5. විධි ක්‍රියා රූප ආශීර්වාද ක්‍රියා අර්ථයේ නොයෙදේ .

6 . ආශිර්වාද ක්‍රියා අතිත කාලයෙහි ද යෙදේ .

7 . අවසාන ක්‍රියා වර්ගයට ආශිර්වාද ක්‍රියා අයත් වේ .

8 . 'දෙනු මැනවි ' විධි ක්‍රියා රූපයක් වේ .

9 . ආශිර්වාද ක්‍රියා සුබ පැතුමක් භාවිතයේ දී පමණක් යොදා ගැනේ .

10 . 'පන්' , 'පල්ලා' ප්‍රත්‍ය එකතු වීමෙන් විධි ක්‍රියා පද සෑදේ .

# ක්‍රියාකාරකම 5

★ පද්‍ය දෙකෙහි ඇතුළත් විධි ක්‍රියා හා ආශීර්වාද ක්‍රියා උපුටා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

තිත්ත කැකිරි ගෙඩි මාමාට දීපන්
තෙලෙං කැකිරි ගෙඩි නැන්දට දිපන්
පුංචි රබානේ ගින්දර දාපන්
ගහන රබන් පද හරියට ගහපන්

කැළේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා
අව්වේ තිබෙන රැස් මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාළිග සෑදේවා

| | විධි ක්‍රියා | ආශීර්වාද ක්‍රියා |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

## ක්‍රියාකාරකම 6

❖ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු විධි ක්‍රියා පද වරහනින් තෝරා ලියන්න .

1. මිතුර මගෙ ලිපියට පිළිතුරු ………………..

2 . මෙහෙකරුවනි , පැවරූ කාර්යය ……………………

3 . දුවන මුවන් දැක …………………… නෙළුව පලා

4 . ලියක මහිම …………….. ගෝමර ඉසීලා

5. දැන්වීම් ඇලවීම …………………

6 . ඔබේ අංකය මතක …………………….

7 . ස්වාමිනි , බණට ………………..

8 . නිති පන්සිල් …………………….

9 . සාදුකාර දී ඔරුවක නැඟී ……………………

10 . සිංහලයිනි , ……………………….

( වරෙන් . තහනම් , ඉටු කරනු , තබාගන්න , රකිමු නොදමව් , එවන්න , බල වඩිනු මැනවි නැගිටිව් )

## ප්‍රායෝගික අභ්‍යාසය

“සැබෑ ළෙන්ගතුකම ” පාඩමේ ඇතුළත් විධි ක්‍රියා පද හා ආශීර්වාද ක්‍රියා පද උපුටා වගු ගත කරන්න .

❖ # පිළිතුරු

## ක්‍රියාකාරකම 1

1 . විධි ක්‍රියා පද

2 . අවසාන  ක්‍රියා

3 . විධි ක්‍රියා

4 . ආශීර්වාද ක්‍රියා

5 . ප්‍රාර්ථනා ක්‍රියා

## ක්‍රියාකාරකම 2

1 . අසන්න

2 . කරනු මැනවි

3 . ගයව් , වරෙව් , තබව්

4 . කියවන්න

5 . බලනු

6 . කරව

7 . නොදෙන්න

8 . බලන්

9 . යව්

10 . දමපිය  , පිඹපිය ,

## ක්‍රියාකාරකම 3

1 . රස වේවා

2 . දිනේවා

3 . දීර්ඝායු වේවා

4 . සමත් වෙමුවා

5 . දුරුවේවා

6 . වසීවා

7 . නොවෙත්වා

8 . උදා වේවා

9 . හරිනු

10 . තුරන් වේවා

## ක්‍රියාකාරකම 4

1 - √

2 - √

3 - X

4 - X

5 - √

6 - X

7 - √

8 - √

9 - X

10 - √

## ක්‍රියාකාරකම 5

| | විධි ක්‍රියා | ආශිර්වාද ක්‍රියා |
|---|---|---|
| 1 | දීපන් | රස වේවා |
| 2 | දීපන් | ඇති වේවා |
| 3 | දාපන් | අඩු වේවා |
| 4 | ගහපන් | සැදේවා |

## ක්‍රියාකාරකම 6

1 . එවන්න

2 . ඉටු කරනු

3 . නොදමව්

4 . බල

5 . තහනම්

6 . තබාගන්න

7 . වඩිනු මැනවි

8 . රකිමු

9 . වරෙන්

10 . නැගිටිව්